# කදිරගාමර් ඝාතනය

කදිරගාමර් මහතාගේ ඝාතනයට වගකිවයුත්තෝ කවරහු ද? ඒ මහතා ඝාතනය කරනු ලැබුයේ කොටි සංවිධානය විසින් බව පැවසීමට ආණ්ඩුවට තරමක් කල්ගත විය. ජනාධිපතිනිය මුල දී කියා සිටියේ ඒ දේශපාලන සතුරන්ගේ වැඩක් ලෙස ය. ඒ සමග නම නොකී නිලධාරියකු කියා තිබුණේ ඒ සාකච්ඡාවෙන් ලබාගන්නා විසඳුමකට අකමැති අයගේ වැඩක් ලෙස ය. මුල දී ආණ්ඩුව සූදානම් වූයේ ඝාතනයේ වගකීම ඊනියා සිංහල ජාතිවාදීන් පිට පැටවීමට බැරිනම් ඇතැම් අවස්ථාවල දී කර ඇති ආකාරයට කොටින්ට සුදුහුණු ගෑමට ය. සාකච්ඡාවෙන් ලබාගන්නා විසඳුමකට විරුද්ධවන්නන් සිටින්නේ සිංහල ජාතිවාදීන් යැයි කියන්නන් අතර බව, පත්තර කඩමාළුවල ජනමාධ්‍යවේදීන් යැයි කියාගන්නෝ ද දනිති. තාරකී නම් දෙමළ ජනමාධ්‍යවේදියා ඝාතනය කරනු ලැබූ අවස්ථාවෙහි මේ ජනමාධ්‍යවේදියෝ කොටුව දුම්රියපොළ ඉදිරියේ පිකට්ටුවක් පැවැත්වූහ. ඔවුන්ට මුල් දිනවල අවශ්‍ය වී තිබුණේ තාරකීගේ ඝාතනයේ වගකීම ද සිංහල ජාතිවාදීන් යැයි කියන්නවුන් මත පැටවීමට ය. එහෙත් ඒ සඳහා කිසිම සාක්ෂියක් නොතිබූ හෙයින් ඔවුහු වැඩිකල් නොගොස් ම මාතෘකාව අත්හැර දැමූහ. කදිරගාමර් මහතාගේ මරණය පිළිබඳව තවමත් ඊනියා ප්‍රබුද්ධයන් කිසිවක් කියා නැත. එහෙත් සතිඅන්ත පත්තර කඩමාළුවල ඔවුන් බඩපිනුම් ගසනු ඇත. ඔවුන්ගේ අවාසනාවකට ඔවුන්ට ඒ ඝාතනය පිළිබඳ වගකීම සිංහල බෞද්ධයන් මත පැටවීමට සාක්ෂි නැත. එහෙත් ඔවුන්ට දැනටමත් ඒ කරන්නේ කෙසේ දැයි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පෙන්වා දී ඇත.

කදිරගාමර් මහතා සිංහලයන්ගේ මිතුරෙක් හා දේශප්‍රේමියෙක් විය. ඔහුට ඉහළම බ්‍රිතානි අධ්‍යාපනයක් ලංකාවේ දී මෙන් ම එතෙර ද ලැබිණි. එහෙත් ඉහළ බ්‍රිතානි අධ්‍යාපනයක් ලැබූ බොහෝ දෙමළ ජනවාර්ගිකයන් හා ඇතැම් සිංහලයන් ද මෙන් නොව කදිරගාමර් මහතා බ්‍රිතානි යුගයේ සිංහල බෞද්ධයන්ට සිදු වී ඇති අසාධාරණය දුටුවේ ය. දෙමළ ක්‍රිස්තියානි (ඇංග්ලිකන්) පවුලක උපත ලැබූ ඒ මහතා බ්‍රිතානි යුගයේ ක්‍රිස්තියානින්ට ලැබුණු විශේෂ වරප්‍රසාද කවරේදැයි දැනසිටියාට සැකයක් නැත. බොහෝ සිංහල ක්‍රිස්තියානිහු ද ඒ බව දනිති. බ්‍රිතානි යුගයේ අඩුම සැලකිලි ලැබුවෝ සිංහල බෞද්ධයෝ ය. ඒ අසාධාරණය නැතිකර ගැනීමට සිංහලයන් හා විශේෂයෙන් සිංහල බෞද්ධයන් ඉදිරියට පැමිණි සෑම අවස්ථාවකම දෙමළ ජාතිවාදීහු ද ක්‍රිස්තියානි පල්ලිය ද එයට විරුද්ධ වූහ. එහෙත් වාසනාවකට කදිරගාමර් මහතා වැන්නෝ සිදුවන්නේ සිංහල බෞද්ධයන් තම ආධිපත්‍යය දෙමළ හා වෙනත් ජනවාර්ගිකයන් මත පැටවීමක් නොව තම නැතිවී ගිය අයිතිවාසිකම් දිනාගැනීමක් බව දුටුවෝ ය. බොහෝ සිංහල ක්‍රිස්තියානින්ට හා කතෝලිකයන්ට නව තත්ත්වයට හැඩගැසීමට හැකි වුව ද, බොහෝ ක්‍රිස්තියානි හා කතෝලික පූජකයන්ට තම වරප්‍රසාද නැතිවී යෑම දරාගත නොහැකි විය. මේ පූජකයන් පමණක් නොව ඇතැම් මාක්ස්වාදීහු ද සිංහල බෞද්ධයන්ට විරුද්ධ වූහ. ඒ කසිකබල් මාක්ස්වාදයේ දරිද්‍රතාව හේතුවෙන් ය.

මේ කසිකබල් මාක්ස්වාදීන් හා ඊනියා ජනමාධ්‍යවේදීන් තම පත්තර කඩමාළු හරහා කියනු ඇත්තේ සිංහලයන්ට සිංහලයන් අතරින් කදිරගාමර් කෙනකු සොයාගැනීමට නොහැකිවීම පිළිබඳව ය. එමගින් සිංහලයන්ට පරිභවකිරීමට ඔවුන් අදහස්කරනු ඇත. දෙමළ ජනයාට වඩා සිංහලයන් කදිරගාමර් ඝාතනය ගැන දුක්වීම පිළිබඳ ඔවුන් කඩමාළුවල පිටුගනන් ලියනු ඇත. එහෙත් ඔවුන් නොකියන කරුණක් වනු ඇත්තේ සාමාන්‍ය දෙමළ ජනයාට තම මතය ප්‍රකාශකිරීමට දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා යැයි බටහිරයන්ගේ උපකාරයෙන් බෙරිහන් දෙන කොටි සංවිධානය ඉඩ නො දෙන බව ය.

සිංහලයන් ජාතිවාදීන් යැයි කීමට දත කට මැදගෙන සිටින ඊනියා ප්‍රබුද්ධයනට අමතකවන කරුණක් නම් ජාතිවාදීන් යැයි හැඳින්වෙන බොහෝ සිංහලයන් කදිරගාමර් මහතා අගමැති පදවියට පත්වනු දැකීමට කැමැත්තෙන් සිටි බව ය. එමෙන් ම මෙරට බොහෝ විදේශ අමාත්‍යවරුන් හා විදේශවල සේවය කරන තානාපතිවරුන්ගෙන් විශාල ප්‍රමාණයක් සිංහල බෞද්ධයන් නොවන බව ඔවුහු නොකියති. බොහෝ විට ලංකාවෙන් මුස්ලිම් රටවලට තානාපතිවරුන් පත්කිරමේ දී ඒ අය මුස්ලිම්වනු දැකීමට ආණ්ඩුව උත්සාහකරන බව රහසක් නො වේ. එහෙත් යම් බෞද්ධ ජනගහණයක් ඇති රටවලින් පවා මෙරටට තානාපතිවරුන් වශයෙන් සාමාන්‍යයෙන් බෞද්ධයෝ පත්නොකෙරෙති. එයට හේතුව කුමක් ද? මෙරට බෞද්ධ රටක් වශයෙන් නොසැලකීම ද? එසේත් නැත්නම් ඒ රටවල තානාපතිවරුන්

© Prof. Nalin De Silva

පත්කිරීමේ දී එවැනි කරුණු නොසලකා සිටීම ද? එයට හේතුව ඔවුන්ගේ ප්‍රබුද්ධත්වය ද? මේ එකක්වත් අපි නොදනිමු. අප එය දැනගන්නේ කාගෙන් ද?
කදිරගාමර් ඝාතනය සමග බටහිර රටවල් එක හඬින් ගයන ගීතය බවට වී ඇත්තේ ඊනියා සටන් විරාමය කිනම් කොන්දේසියකටවත් යටත් නොවී දිගටම ක්‍රියාත්මක විය යුතු ය යන්න ය. මෙරට සිටින දීන අනුකාරක රොත්ත ද දිගට ම බටහිර රටවල් සමග මේ සම්බන්ධයෙන් එකඟවනු ඇත. එමෙන් ම ඔවුන් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අනුගමනය කරමින් කදිරගාමර් ඝාතනයේ වගකීම ද වක්‍ර ව හෝ සිංහල බෞද්ධයන් මත පැටවීමට උත්සාහ දරණු ඇත. ඝාතනයෙන් පසුව සුදු සාරියකින් සැරසී ඇඬූ කඳුලෙන් මෙන් කුමාරතුංග මහත්මිය කියා සිටියේ දෙමළ ජනයාට ඉතා සුළුවෙන් හෝ යමක් දීමට ඇය උත්සාහ කළ සෑම අවස්ථාවක ම එයට විරුද්ධ වූ අන්තවාදීන් ද ඝාතනයට වගකිව යුතු බව ය. යමක් දෙන්නේ කුමක් සඳහා ද? කෙලෙසකින් හෝ ඝාතනය පිලිබඳ ව කොටි සංවිධානයට එතරම් වගකීමක් නොපැවරීම රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා උගතුන්ගේ කොන්ත්‍රාත්තුව වනු ඇත.

ඊනියා සටන් විරාමය පිටුපස සිටියේ නෝර්වේ ආණ්ඩුව හා සෙසු බටහිර ආණ්ඩු ය. එයට අත්සන් තැබුයේ රනිල් වික්‍රමසිංහ මහතා හා ප්‍රභාකරන් ය. ඉන් කෙරුණේ කොටින්ට රිසිසේ තම ප්‍රතිවාදීන්, හමුදා නිලධාරීන් ආදීන් මැරීමට බලපත්‍රයක් ලබාදීම ය. ඒ වෙනුවෙන් ඔවුහු කොළඹ බෝම්බ පිපිරීමෙන් වැළකී සිටියහ. කොටි තම ඝාතන කරද්දී හමුදාව අක්‍රීය ව අහක බලන් සිටියේ ය. ආරක්ෂක කපොළු ඉවත්කිරීම හේතුවෙන් කොටි ඝාතකයෝ තොග පිටින් කොළඹ නගරයට ඇතුල්වූහ. කදිරගාමර් ඝාතනයට කොටි මෙන් ම ඊනියා සටන් විරාමය පිටුපස සිටි බටහිරයන් ද, එයට අත්සන් තැබුවන් හා ඔවුන්ගේ පක්ෂ ද පමණක් නොව ඒ පාවාදීමේ ගිවිසුම දිගට ම ක්‍රියාත්මක කළ සන්ධාන ආණ්ඩුවේ පක්ෂ හා එහි නායක නායිකාවන් ද වගකිව යුතු ය. මෑතක දී උසස් පොලිස් නිලධාරියකු ඝාතනය කෙරුණු අවස්ථාවේ දී ආණ්ඩුවේ ඉහළ ම නායිකාවක කියා ඇත්තේ සටන් විරාමය නොතිබෙන්නට දැනට වඩා පුද්ගලයන් ඝාතනය වීමට තිබුණු බව ය. එහෙත් ජාතිය ම පාවාදුන් ඊනියා සටන් විරාමය නොතිබෙන්නට කදිරගාමර් මහතා අදත් ජීවත්වනු ඇත. බටහිරයන්ට හා ඔවුන්ගේ අතවැසි සේවකයන් වූ නිවට දීන ඊනියා උගතුන්ට අවශ්‍ය ඊනියා සටන් විරාමය පවත්වාගෙන ගොස් තව තවත් කොටි ශක්තිමත්කිරීමත් හමුදාව අධෛර්යට පත්කිරීමත් ය.

සටන් විරාමය කොටි සාකච්ඡා මේසයට කැඳවා ගැනීම සඳහා යැයි කියන පාවාදෙන්නවුන්ට කිවයුත්තේ එතරම් බොරුවක් ලෝක ඉතිහාසයේ කෙදිනකවත් කියා නොමැති බව ය. කොටින්ට සාකච්ඡා අවශ්‍ය නැත. ඔවුන්ට අවශ්‍ය ඊළම ය. අනෙක් අතට බටහිර රටවල් සාකච්ඡා සඳහා අනුගමනය කරන්නේ එවැනි පිළිවෙතක් ද? අයි ආර් ඒ සංවිධානය සමග සාකච්ඡාකිරීමට බ්‍රිතානි ආණ්ඩුව කොන්දේසි පනවයි. ඉන් එකක් වනුයේ ඒ සංවිධානය නිරායුධකිරීම ය. ඇමරිකාව අල් ක්වේඩා සංවිධානය සමග සාකච්ඡාකිරීමට සිහිනෙන්වත් සිතන්නේ ද? ඊනියා සාමය යනුවෙන් බටහිරයන් කොටි හා රාජ්‍ය නොවන ගැත්තන් අදහස්කරන්නේ ඊළම බැරිනම් සහසන්ධීය රාජ්‍යයක් දෙමළ ජාතිවාදයට ලබා දීම ය. අපට සාමය යනු ඒකීය රාජ්‍යය රැකගැනීම ය. බ්‍රිතානීන්ට පෙර මෙරට ඒකීය රාජ්‍යයක් නොතිබූ බව කියමින් සන්ධීය රාජ්‍යයක් ගැන මෑත දොඩවන බටහිරයන්ගේ පොතපතින් ඉතිහාසය හා දේශපාලන විද්‍යාව උගත් කල්පනාකිරීමට නොහැකි එහෙත් කටපාඩම්කර කරුණු ඉදිරිපත්කිරීමට හැකි ඇතැම් කසිකබල් ඉතිහාස හා දේශපාලන විද්‍යා මහාචාර්යවරුන්ට හා උගතුන්ට අප කිහිපවතාවක් ම පිළිතුරු දී ඇත. අවශ්‍ය නම් ඔවුන් සමග ප්‍රසිද්ධ විවාදයකට අප සූදානම් ය. අද අවශ්‍ය වන්නේත් එදා අවශ්‍ය වූයේත් සටන් විරාමය ඉරාදමා පුච්චා එහි අළු සොල්හයිම්ගේ නළලේ ගා ඔහු හා ඔහුගේ සගයන් පිටමන්කර හමුදා ක්‍රියාමාර්ගවලින් කොටි පරාජයකිරීම ය. අවශ්‍ය නම් එයට යුද්ධය යැයි කිව හැකි ය. යුද්ධය ද දේශපාලන විසඳුමක් බවත් යුද්ධය යනු දේශපාලනයේ එක් ස්වරූපයක් බවත් අවධාරණය කළ යුතු ය. යටත්විජිතවාදී බටහිරයන් ද බටහිරයන් ඉදිරියේ දෙකට නැමෙන නොව හතරගාතයෙන් ඇද වැටී බඩගාන නිවටයන් ද අසනු ඇත්තේ යුද්ධකරන්නේ කෙසේ ද කියා ය. එයට පිළිතුරු හමුදාවේ බොහෝ සෙබළු දනිති. සටන් විරාමයක් පවත්වාගෙන ගොස් කොටින්ට කොළඹ විවෘත කර ජනාධිපතිනිය තම දක්ෂ විදේශ ඇමතිවරයා නැතිකරගත්තා ය. ඇය තවදුරටත් රටේ නායිකාව ලෙස සිටීමෙන් රටට වන යහපත කුමක් ද? බටහිරයන්ගේ පදයට නටන දේශපාලනඥයන් මෙන් ම ඔවුන්ගේ පොතට අනුව බොරු පණ්ඩිතකම් දෙසන කසිකබල් උගතුන් ද අපට අවශ්‍ය නො වේ. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම වූ අසාධාරණය කුමක් දැයි මොවුන්ට කිව හැකි ද? සිංහලයන්ට සිංහලයන් වීම නිසා ම යාපන අර්ධද්වීපයේ පදිංචිවීමට නො හැකි බව නම් අපි දනිමු.

© Prof. Nalin De Silva